ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව**

දිනය **2015 ජනවාරි මස 23 වැනි දින**

## 2014 නොවැම්බර් මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

**සමස්ත නිරීක්ෂණ**

**ගෙවුම් තුලනයේ වාර්තා වූ අඛණ්ඩ ලැබීම් සමගින් ශ්‍රී ලංකාවේ විදේශීය අංශය තවදුරටත් වර්ධනය විය.** 2014 වසරේ පළමු මාස එකොළහ තුළ දී අපනයන හා සංචාරක ඉපැයුම් මෙන්ම විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලෙස රට වෙත වූ සමුච්චිත විදේශ විනිමය ලැබීම්, ගෙවුම් තුලනයේ ජංගම ගිණුම ශක්තිමත් කළේය. මේ සමඟ, විදේශීය සෘජු ආයෝජන, කොළඹ කොටස් වෙළෙඳපොළ හා පෞද්ගලික අංශය වෙත වූ ලැබීම් ලෙස මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් ගෙවුම් තුලනයේ ඉහළ අතිරික්තයක් වාර්තා කිරීමට උපකාරී විය.

**අපනයන ක්‍රියාකාරිත්වය**

**වසරේ පළමු මාස එකොළහ තුළ දී, අපනයන ආදායමේ සමුච්චිත අගය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් බිලියන 10.1 ක් දක්වා සියයට 7.5 කින් වර්ධනය විය.** කෙසේ වුවද, 2014 නොවැම්බර් මාසයේ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 921 ක් දක්වා සියයට 10.7 කින් අඩු විය. 2013 නොවැම්බර් මාසයේ දී වාර්තා වූ අපනයන ආදායමේ විශාල වර්ධනය, 2014 නොවැම්බර් මාසයේ දී මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. 2014 නොවැම්බර් මාසයේ දී අපනයන ආදායමේ අඩුවීමට ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන යටතේ වර්ග කර ඇති රෙදිපිළි හා ඇඟළුම් අපනයන අඩු වීම ද, අනතුරුව රබර් නිෂ්පාදිත සහ

මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන අඩු වීම ද හේතු විය. 2014 නොවැම්බර් මාසයේ දී යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වෙත කළ ඇඟලුම් අපනයන පිළිවෙලින් සියයට 16.6 කින් සහ සියයට 17.8 කින් අඩු වීමත් සමග රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම සියයට 14.4 කින් අඩු විය. රබර් නිෂ්පාදිත අපනයන ආදායම අඩු වූ අතර මේ සඳහා රබර් ටයර් අපනයනය අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු විය. ඉහළ තේ අපනයන පරිමාවක් තිබුණ ද, මිල අඩු වීම හේතුවෙන් තේ අපනයන ආදායම සියයට 4.5 කින් අඩු විය. මේ අතර, කුරුඳු, ගම්මිරිස් සහ කරාබු නැටි ආදී ඇතැම් කුළුබඩු වර්ගවල මිල ඉහළ මට්ටමක පැවතිය ද කුළුබඩු නිෂ්පාදනය අඩු වීම නිසා අපනයන පරිමාව පහළ යාම හේතුවෙන් කුළුබඩු අපනයන ආදායම අඩු විය. කෙසේ වුවද, පොල් නිෂ්පාදිත සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන තවදුරටත් පුළුල් කිරීමේ ඇති හැකියාව පෙන්නුම් කරමින්, එම අපනයන පිළිවෙලින් සියයට 32.6 කින් සහ සියයට 69.1 කින් වර්ධනය විය. 2014 පළමු මාස එකොළහ තුළ දී ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉතාලිය, ඉන්දියාව හා ජර්මනිය ශ්‍රී ලංකාවේ වෙළෙඳ භාණ්ඩ අපනයන සඳහා තවදුරටත් ප්‍රධාන වෙළෙඳපොළවල් වූ අතර එය මුළු අපනයනයෙන් සියයට 50 ක් පමණ විය.

**සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම**


| වර්ගය | 2013 නොවැ. (එ.ජ.ඩො. මිලියන) | 2014 නොවැ. (එ.ජ.ඩො. මිලියන) | වර්ධනය (සියයට) | 2013 ජන.-නොවැ. (එ.ජ.ඩො. මිලියන) | 2014 ජන.-නොවැ. (එ.ජ.ඩො. මිලියන) | වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **775.8** | **684.1** | **-11.8** | **7,006.6** | **7,492.8** | **6.9** |
| රෙදිපිළි හා ඇඟලුම් | 491.4 | 420.7 | -14.4 | 4,054.4 | 4,478.9 | 10.5 |
| රබර් නිෂ්පාදිත | 83.5 | 69.6 | -16.7 | 793.9 | 816.9 | 2.9 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 40.3 | 27.7 | -31.1 | 418.3 | 347.0 | -17.1 |
| ප්‍රවාහන උපකරණ | 6.4 | 4.4 | -31.7 | 141.7 | 115.2 | -18.7 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ_ | 34.4 | 29.1 | -15.5 | 285.3 | 312.0 | 9.4 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 28.6 | 29.9 | 4.3 | 396.6 | 313.6 | -20.9 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 21.7 | 25.0 | 15.2 | 214.1 | 264.5 | 23.5 |
| වෙනත් | 69.5 | 77.7 | 11.8 | 702.3 | 844.6 | 20.3 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **244.0** | **233.1** | **-4.4** | **2,338.9** | **2,544.5** | **8.8** |
| තේ | 144.1 | 137.6 | -4.5 | 1,393.8 | 1,488.6 | 6.8 |
| පොල් | 20.8 | 27.6 | 32.6 | 184.5 | 329.8 | 78.8 |
| මුහුදු ආහාර | 23.0 | 20.1 | -12.7 | 210.5 | 230.9 | 9.7 |
| කුළුබඩු | 34.9 | 23.3 | -33.3 | 329.4 | 236.2 | -28.3 |
| වෙනත් | 21.1 | 24.6 | 16.5 | 220.7 | 259.0 | 17.4 |
| **3. ඛනිජ වර්ග සහ වෙනත්** | **12.1** | **3.9** | **-67.7** | **61.0** | **70.6** | **15.6** |
| **මුළු අපනයන** | **1,031.8** | **921.1** | **-10.7** | **9,406.6** | **10,107.8** | **7.5** |

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ආනයන ක්‍රියාකාරිත්වය

**2014 නොවැම්බර් මාසයේ දී ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,645 ක් දක්වා සියයට 4.8 කින් වර්ධනය වූ අතර සමුච්චිත වශයෙන් සැලකුවිට 2014 පළමු මාස එකොළහේදී ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 17,618 ක් දක්වා සියයට 7.1 කින් වර්ධනය විය.** 2014 නොවැම්බර් මාසයේ ආනයන වියදමෙහි වර්ධනය සඳහා මෝටර් සයිකල් සහ මෝටර් කාර් වැනි පෞද්ගලික වාහන මෙන්ම සහල් ආනයනයේ සැලකිය යුතු වර්ධනයත් සමඟ පාරිභෝගික භාණ්ඩ ආනයනයේ සිදු වූ වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු විය. 2014 නොවැම්බර් මාසයේ දී ඉන්ධන, තිරිඟු හා ඉරිඟු සහ ආහාර සැකසුම් ආනයන සැලකිය යුතු ලෙස අඩු වුවද අන්තර් භාණ්ඩ ආනයනය සුළු වශයෙන් වර්ධනය විය. රෙදිපිළි හා රෙදිපිළි උපාංග, පොහොර, රසායනික නිෂ්පාදිත, රබර් හා රබර් ආශ්‍රිත උපාංග සහ කඩදාසි හා සන කඩදාසි ආනයනය මෙම මාසය තුළ දී සැලකිය යුතු ලෙස වර්ධනය විය. මහ කන්නය සඳහා පොහොර විශාල ප්‍රමාණයක් ආනයනය කිරීම හේතුවෙන් 2014 නොවැම්බර් මාසයේ දී පොහොර ආනයනය සියයට 75.7 කින් වර්ධනය විය. මේ අතර, ඉන්ධන සඳහා වූ ආනයන වියදම සියයට 26.5 කින් අඩු වූ අතර, අඩු මිල ගණන් සහ අඩු පරිමාව හේතුවෙන් බොරතෙල් ආනයන වියදමේ සිදු වූ සැලකිය යුතු අඩු වීම මේ සඳහා හේතු විය. මේ අතර, සියලුම උප කාණ්ඩයන්ගේ ආනයනයන්හි අඩුවීම් පිළිබිඹු කරමින් ආයෝජන භාණ්ඩ ආනයනය සියයට 10.4 කින් අඩු විය. 2014 පළමු මාස එකොළහ තුළ දී ප්‍රධානතම ආනයන ප්‍රභවයන් ලෙස තවදුරටත් ඉන්දියාව, චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සිංගප්පූරුව සහ ජපානය පැවති අතර, එය මුළු ආනයනයන්ගෙන් සියයට 59 ක් පමණ විය.

රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය






සංඛ්‍යා සටහන 2: ආනයන වියදම

| වර්ගය | 2013 නොවැ. (එ.ජ.ඩො. මිලියන) | 2014 නොවැ. (එ.ජ.ඩො. මිලියන) | වර්ධනය (සියයට) | 2013 ජන.-නොවැ. (එ.ජ.ඩො. මිලියන) | 2014 ජන.-නොවැ. (එ.ජ.ඩො. මිලියන) | වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **261.2** | **365.1** | **39.8** | **2,880.3** | **3,430.4** | **19.1** |
| ආහාර හා පාන වර්ග | 102.6 | 147.8 | 44.0 | 1,230.7 | 1,464.5 | 19.0 |
| කිරි නිෂ්පාදිත | 18.3 | 25.4 | 39.0 | 256.3 | 318.0 | 24.1 |
| වෙනත් | 84.4 | 122.3 | 45.0 | 974.4 | 1,146.4 | 17.7 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 158.5 | 217.3 | 37.1 | 1,649.5 | 1,965.9 | 19.2 |
| රථවාහන | 53.4 | 94.1 | 76.1 | 532.9 | 785.2 | 47.3 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 26.9 | 30.8 | 14.8 | 343.8 | 344.8 | 0.3 |
| වෙනත් | 78.2 | 92.4 | 18.2 | 772.8 | 836.0 | 8.2 |
| **2. අන්තර් භාණ්ඩ** | **893.9** | **907.8** | **1.6** | **9,617.4** | **10,459.1** | **8.8** |
| ඉන්ධන | 363.2 | 266.9 | -26.5 | 3,854.6 | 4,339.7 | 12.6 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 182.8 | 215.7 | 18.0 | 1,871.7 | 2,101.8 | 12.3 |
| රසායනික නිෂ්පාදිත | 54.9 | 74.5 | 35.7 | 659.7 | 723.6 | 9.7 |
| ප්ලාස්ටික් හා උපාංග | 45.2 | 51.6 | 14.1 | 467.7 | 549.3 | 17.4 |
| මූල ලෝහ | 37.6 | 49.5 | 31.5 | 387.3 | 440.5 | 13.7 |
| කඩදාසි සහ ඝන කඩදාසි | 35.7 | 47.9 | 34.5 | 342.2 | 440.4 | 28.7 |
| තිරිඟු හා ඉරිඟු | 34.0 | 14.9 | -56.2 | 314.3 | 357.0 | 13.6 |
| පොහොර | 30.8 | 54.1 | 75.7 | 222.7 | 248.2 | 11.5 |
| වෙනත් | 109.7 | 132.6 | 20.9 | 1,497.2 | 1,258.6 | -15.9 |
| **3. ආයෝජන භාණ්ඩ** | **414.1** | **371.1** | **-10.4** | **3,941.8** | **3,715.1** | **-5.8** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 188.3 | 180.0 | -4.4 | 2,056.8 | 1,923.9 | -6.5 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 114.5 | 97.9 | -14.6 | 1,249.3 | 1,181.5 | -5.4 |
| ප්‍රවාහන උපකරණ | 110.6 | 92.2 | -16.6 | 630.3 | 605.9 | -3.9 |
| වෙනත් | 0.6 | 1.0 | 62.3 | 5.4 | 3.8 | -30.0 |
| **මුළු ආනයන** | **1,569.7** | **1,645.1** | **4.8** | **16,451.7** | **17,617.6** | **7.1** |

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**වෙළෙඳ ශේෂය**

**2013 නොවැම්බර් මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 538 ක් වූ වෙළෙඳ හිඟය 2014 නොවැම්බර් මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 724 ක් දක්වා පුළුල් විය.** ඒ අනුව, 2014 වසරේ පළමු මාස එකොළහ තුළ දී වෙළෙඳ හිඟය 2013 වසරේ එම අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 6.6 කින් වර්ධනය විය.

**සංචාරක ඉපැයුම්**

**2014 වසරේ නොවැම්බර් මාසයේ දී සංචාරක පැමිණීම් 2013 නොවැම්බර් මාසයේ දී වූ 109,420 සිට 119,727 දක්වා සියයට 9.4 කින් වර්ධනය විය.** 2014 වසරේ නොවැම්බර් මාසය තුළ දී ඉන්දියාව, චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය සහ මාලදිවයින සංචාරකයින් පැමිණීමේ ප්‍රධාන මූලාශ්‍ර පහ වූ අතර මාසය තුළදී සිදු වූ මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 49.1 කට පමණ මෙම මූලාශ්‍ර දායක විය. සංචාරක ඉපැයුම්

2013 නොවැම්බර් මාසයේ වූ එ.ජ.ඩොලර් මිලියන 147.3 ට සාපේක්ෂව 2014 වසරේ නොවැම්බර් මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 173 දක්වා සියයට 17.5 කින් වර්ධනය වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මේ අතර, වසරේ නොවැම්බර් මාසය දක්වා කාලය තුළ මුළු සංචාරක පැමිණීම් සියයට 20.3 ක වර්ධනයක් වාර්තා කළ අතර සංචාරක ඉපැයුම් එ.ජ.ඩොලර් මිලියන 1,948.3 දක්වා සියයට 29.2 කින් වර්ධනය විය.

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**

**2014 නොවැම්බර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, 2013 නොවැම්බර් මාසයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 567.8 සිට එ.ජ.ඩොලර් මිලියන 619.3 දක්වා සියයට 9.1 කින් වර්ධනය විය.** මේ අතර, 2014 වසරේ පළමු මාස එකොළහ තුළ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණයන්හි සමුච්චිත ලැබීම් 2013 වසරේ අනුරූප කාල පරිච්ඡේදයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 5,804.1 සිට එ.ජ.ඩොලර් මිලියන 6,309 දක්වා සියයට 8.7 කින් වර්ධනය විය.

**මූල්‍ය ලැබීම්**

**2014 වසරේ නොවැම්බර් මස දක්වා වූ කාලය තුළ කොළඹ කොටස් වෙළෙඳපොළ, බැංකු අංශය සහ රජය වෙත වූ අඛණ්ඩ ලැබීම් හේතුවෙන් ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුම ශක්තිමත් විය.** වසරේ පළමු මාස එකොළහ සඳහා රජය වෙත වූ දිගුකාලීන ණය ලැබීම් 2013 වසරේ අනුරූප කාල පරිච්ඡේදයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 1,547.8 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,438.7 ක් විය. මෙම කාලපරිච්ඡේදය තුළ දී කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම්, 2014 නොවැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 43.3 ක ශුද්ධ ලැබීම් ද සමඟ එ.ජ.ඩොලර් මිලියන 150.2 ක් විය. තවද, 2014 වසරේ පළමු මාස එකොළහ තුළ දී බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත වූ ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 450 ක් විය. මේ අතර, 2014 නොවැම්බර් මස අග වන විට රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ එ.ජ.ඩොලර් මිලියන 104.3 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

2014 ජනවාරි සිට නොවැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදය තුළ දී ගෙවුම් තුලනය, 2013 වසරේ අනුරූප කාල පරිච්ඡේදයේ වූ එ.ජ.ඩොලර් මිලියන 581.7 ක අතිරික්තයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,628.3 ක අතිරික්තයක් වාර්තා කරනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

## ජාත්‍යන්තර සංචිත

**එ.ජ.ඩොලර් මිලියන 2,054.2 ක විදේශ ණය සේවාකරණ ගෙවීම් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීපස්ථ ණය පහසුකම සඳහා වූ එ.ජ.ඩොලර් මිලියන 704.4 ක ගෙවීම් හමුවේ වුවද 2014 නොවැම්බර් මස අග වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය තවදුරටත් එ.ජ.ඩොලර් බිලියන 8.3 ක ඉහළ මට්ටමක පවත්වා ගැනුණි.** මේ අතර, බැංකු අංශයේ විදේශීය වත්කම් ද ඇතුළුව මුළු විදේශීය වත්කම් ප්‍රමාණය එ.ජ.ඩොලර් බිලියන 9.6 ක් විය. ආනයනික මාස වශයෙන් සැලකූ විට 2014 වසරේ නොවැම්බර් මස අග වන විට දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 5.2 කට සමාන වූ අතර, මුළු විදේශීය වත්කම් ආනයනික මාස 6.0 කට සමාන විය.

## විනිමය අනුපාතිකයේ හැසිරීම

**2014 වසර අග වන විට එ.ජ.ඩොලරයට එරෙහිව රුපියල සියයට 0.3 කින් සුළු වශයෙන් අවප්‍රමාණය වෙමින් ස්ථාවරව පැවතුණි.** 2014 වසර අග වන විට විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතික හැසිරීම මත පදනම්ව ශ්‍රී ලංකා රුපියල ජපන් යෙන්වලට එරෙහිව සියයට 13.5 කින් ද, යූරෝවලට එරෙහිව සියයට 13.2 කින් ද, කැනේඩියානු ඩොලරයට එරෙහිව සියයට 8.5 කින් ද, ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 8.4 කින් ද, ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 5.7 කින් සහ ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 2.1 කින් අධිප්‍රමාණය විය.

**සංඛ්‍යා සටහන 3. විදේශ අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශයක් (අ)**

| | 2013 නොවැ. (එ.ජ.ඩො. මිලියන) | 2014 නොවැ. (එ.ජ.ඩො. මිලියන) | නොවැ. වර්ධනය (සියයට) | 2013 ජන. සිට නොවැ. (එ.ජ.ඩො. මිලියන) | 2014 ජන. සිට නොවැ. (එ.ජ.ඩො. මිලියන) | ජන. සිට නොවැ. වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 1,031.8 | 921.1 | -10.7 | 9,406.6 | 10,107.8 | 7.5 |
| ආනයන | 1,569.7 | 1,645.1 | 4.8 | 16,451.7 | 17,617.6 | 7.1 |
| වෙළෙඳ ශේෂය | -537.8 | -724.1 | 34.6 | -7,045.1 | -7,509.8 | 6.6 |
| සංචාරක ඉපැයුම් | 147.3 | 173.0 | 17.5 | 1,508.3 (ආ) | 1,948.3 | 29.2 |
| අනෙකුත් සේවා වෙළෙඳාම් වෙත වූ ලැබීම් (ඇ) | | | | 2,230.5 (ආ) | 2,447.9 | 9.7 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 567.8 (ආ) | 619.3 | 9.1 | 5,804.1 (ආ) | 6,309.0 | 8.7 |
| කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) | -3.9 | 43.3 | | 267.2 | 150.2 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ) | 185.4 | 95.9 | -48.2 | 3,992.7 | 4,726.6 | 18.4 |
| එයින්: | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 76.1 | 74.1 | -2.6 | 2,405.0 | 1,711.2 | -28.8 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | | | | | 1,500.0 | |
| දිගුකාලීන ණය | 95.2 | 21.8 | -77.1 | 1,547.8 | 1,438.7 | -7.0 |
| විදේශීය සෘජු ආයෝජන (ඇ) | | | | 874.3 | 1,188.0 | 35.9 |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) එක් එක් කාල පරිච්ඡේදය සඳහා අදාළ දත්ත පළමු මාස නවය සඳහා වේ.
(ඈ) රජය ලද ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර විකිණීමෙන් ලද ලැබීම්, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.